**අම්පාර නගර සභාව - 2023**
-------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අම්පාර නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද අතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අම්පාර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ කඩ කුලී ආදායම රු.702,818ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ කඩ කුලී උපලේඛන අනුව දෙසැම්බර් 31 දිනට හිග කඩ කුලී දඩ මුදල රු.1,363,009ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2024 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කුලී හිඟ ආදායම රු.1,630,817ක් අඩුවෙන් දක්වා තිබුණි. | නැවත සොයා බැලීමක් සිදු කොට යම් වෙනසක් ඇති බවට සනාථ වුවහොත් ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලින් එය නිවැරදි කරන බව. | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු හා උසාවි දඩ හිඟ ශේෂය රු.3,318,250ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 අවසන් ගිණුම්වලින් නිවැරදි කරන බව. | - එම - |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී අදායම රු.303,642ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | - එම - | - එම - |
| (ඊ) | වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන (AIP) – 2023 යටතේ ඉටුකරන ලද ව්‍යාපෘති 03කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු රු.1,389,540ක වටිනාකම කර්මාන්ත ණයගැති හා කර්මාන්ත ණයහිමි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2024 අවසන් ගිණුම්වලින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පතු වටිනාකම රු.277,633ක් අඩුවෙන් දක්වා තිබුණි. | - එම - | - එම - |
| (ඌ) | සමාලෝචිත වර්ෂයට අදාළව තානායමේ ආරම්භක හා අවසන් තොග ගැලපීම් කර විකුණුම් පිරිවැය රු.31,491,728ක් ආදායම් වියදම් ගිණුමේ දැක්විය යුතු වුවත් ගැනුම් පිරිවැය රු.32,054,955ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.563,227ක් අඩුවෙන් දක්වා තිබුණි. | දෝෂයන් පිළිබඳ නැවත අධ්‍යයනයක් සිදු කළ යුතුය. නිවැරදි කිරීම් වෙතොත් එය 2024 අවසන් ගිණුම් වලින් වලින් නිවැරදි කරන බව. | - එම - |

## 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්‍ා

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ හිටි වරිපනම් වටිනාකම හා වරිපනම් හිඟ ශේෂ ලැයිස්තුවල එකතු වටිනාකම අතර රු.2,853,229ක නොසැසඳීමක් පැවතුණි. | වරිපනම් දත්ත පද්ධතිය හා සම්බන්ධ ආයතනය විසින් දෝෂ නිවැරදි කිරීමෙන් පසු නිවැරදි ශේෂය ඉදිරි මූල්‍ය ප්‍රකාශන සඳහා ඇතුළත් කරන බව. | නිවැරදි ශේෂය හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සාරාංශ වියදම් ලේඛනය අනුව ගැනුම් වටිනාකම සහ වෙළෙඳ ගිණුමේ ගැනුම් වටිනාකම අතර රු.643,536ක නොසැසඳීමක් පැවතුණි. | නැවත සොයා බැලීමක් සිදු කොට යම් වෙනසක් ඇති බවට සනාථ වුවහොත් ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලින් එය නිවැරදි කරන බව. | - එම - |

## 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ ලිඛිත සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|---|
| (අ) | ලී බඩු හා සවිකිරීම් | 17,663,561 | (i) ස්ථාවර වත්කම් ලේඛන<br>(ii) උපලේඛන | ආරම්භක ශේෂය සම්බන්ධයෙන් නැවත කමිටුවක් පත්කර සංගණනයක් කළ යුතු අතර ඒ සඳහා යම් කාලයක් ගත වන බව. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | කර්මාන්ත තැන්පතු | 968,481 | (i) ගෙවිය යුතු පාර්ශවය හඳුනාගත් උපලේඛන | මෙම ශේෂය 2019 වර්ෂයට පෙර සිට පැවත එන | - එම - |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ශේෂයක් වන අතර ඉදිරි කටයුතු ප්‍රතිපත්ති කමිටු තීරණ මත ගැනීමට බලාපොරොත්තු වන බව. | |
| (ඇ) | වැට් බදු තැන්පතු<br>බදු | 3,106,386<br>39,657 | (i) ලේඛන<br>(ii) ශේෂ සනාථ කිරීම් | මේ සම්බන්ධව විශේෂ සොයා බැලීමක් සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | - එම - |
| (ඈ) | 2022 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි කඩ කුලී ගිණුමේ ශේෂය 2023 ජනවාරි 01 දිනට සමුච්චිත අරමුදලට හර කර කපාහැරීම. | 1,626,640 | කපා හැරීමට නිසි හේතු පිළිබඳ තොරතුරු | නිසි අධ්‍යනයක් සිදු කොට වෙනසක් ඇත්නම් එය 2024 අවසන් ගිණුම් වලින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | හේතු හඳුනාගෙන අනුමැතිය ලබා ගැනීමෙන් පසු කුලී ආදායම් කපා හැරිය යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) | | | |
| | 170 වගන්තිය | නගර සභාවට අයත් දේපල වෙනුවෙන් අයකළ යුතු හිඟ වරිපනම් බදු සහ නගර සභාවට අයත් දේපල කුලියට ලබාදීමෙන් අයවිය යුතු කුලී මුදල වන රු.51,094,421ක වටිනාකම අයකර ගැනීම සඳහා දේපල තහනම් කර සිදුකළ යුතු ක්‍රමවේදයන් ක්‍රියාත්මක | හිඟ වරිපනම් එකතු කරමින් පවතී. තවද නගර සභාවට අයත් කඩ 23ක් පමණ මුද්‍රා තබා අදාළ නීතිමය කටයුතු මේ වන විට | නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීමට නගර සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආරම්භ කර ඇති බව. | |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) මුදල් රෙගුලාසි 880 හා 881 | නගර සභාවේ මුදල් අයකැමි, මුදල් හා චෙක්පත් භාරව සිටින නිලධාරීන්, චෙක්පත් අත්සන් කරන නිලධාරීන්, ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන් සහ ආදායම් පරීක්ෂකවරයා යනාදි වශයෙන් මුදල් සහ වත්කම් භාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණන ආනාවරණයන් අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2023 මැයි 12 දිනැති හා අංක 02/2021(VIII) දරන චක්‍රලේඛය | | | |
| • 2009 අප්‍රේල් 16 දිනැති අංක 2009/09 දරන චක්‍රලේඛයේ 2(iv) වගන්තිය | 2023 මැයි 15 දින සිට චක්‍රලේඛයේ විධිවිධාන නැවතත් ක්‍රියාත්මක කළ යුතු අතර එහි වේලාව පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම්, එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සනාථ කළ යුතු වුවත් ඊට පටහැනිව නගර සභාවේ වැඩබලන | වැඩබලන ගණකාධිකාරි හට කිහිප විටකදීම දැනුවත් කරන ලදී. ඒ අනුව අදාළ නිලධාරියා මේ වන විට ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කරමින් පැමිණීම පිටවීම සලකුණු කරන බව. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ගණකාධිකාරීවරයා වෙත 2023 මැයි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාළව නිවාඩු දින වැටුප් ලෙස රු.46,096ක් ගෙවීම් කර තිබුණි. | | |
| (ii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදය | වාහන ඉන්ධන දහන පරීක්ෂාව මාස 12කට වරක් හෝ කිලෝමීටර් 25,000ක දුර ධාවනය කිරීමෙන් පසුව සිදුකළ යුතු වුවත් නගර සභාව සතු භාවිත තත්ත්වයේ පවතින වාහන 15ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියට සිදු කිරීමට බලාපොරොත්තු වන බව. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,008,803ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,522,976ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට නගර සභාව සතු බැංකු ගිණුම් තුනක රු.16,911,069ක මුදලක් සංචිත වශයෙන් පැවති අතර එම අතිරික්ත මුදලින් 2023 වර්ෂයේ පුනරාවර්තන වියදම් පියවීමට අවශ්‍ය මුදල් තබාගෙන ඉතිරි මුදල් ආදායමක් උපයාගත හැකි මූලාශ්‍රවල ආයෝජනය කර ආදායමක් උපයා ගැනීමට ලේකම්වරයා විසින් කටයුතු කර නොතිබුණි. | තානායමට අයත් බැංකු ගිණුමේ රු.11,862,232ක් ලෙස වැඩිම ඉතිරියක් පෙන්නුම් කරයි. තානායම පෞද්ගලික ආයතන හා තරඟකාරී මට්ටමට වැඩිදියුණු කිරීම සඳහා මේ වන විට සැලසුම් කර ඇති අතර ඒ සඳහා අදාළ ගිණුම තුළ මෙම මුදල් එකතු කර තැබීම සිදු කරන බව. | අතිරික්ත මුදල් ආයෝජනය කර ආදායමක් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම් | 2023 බිල්කළ ආදායම් | 2023 රැස්කළ ආදායම් | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම් | 2022 බිල්කළ ආදායම් | 2022 රැස්කළ ආදායම් | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 11,700,000 | 10,341,122 | 7,786,972 | 37,875,918 | 10,800,000 | 8,872,372 | 6,504,958 | 35,321,768 |
| ii. | කුලී ආදායම | 12,453,126 | 9,617,823 | 8,574,559 | 13,218,503 | 11,528,226 | 8,920,981 | 4,744,811 | 12,175,239 |
| iii. | බලපත්‍ර ගාස්තු | 3,302,000 | 1,475,065 | 1,475,065 | – | 3,702,000 | 1,635,448 | 1,635,447 | – |
| iv. | වෙනත් ආදායම් | 76,502,580 | 68,974,836 | 68,974,836 | – | 63,528,580 | 41,520,104 | 41,520,104 | – |
| v. | එකතුව | 103,957,706 | 90,408,846 | 86,811,432 | 51,094,421 | 89,558,806 | 60,948,905 | 54,405,320 | 47,497,007 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයකර ගත යුතු වරිපනම් බදු මුදල රු.37,875,918 ක් වූ අතර එය වාර්ෂිකව අයකළ යුතු තක්සේරු මුදල මෙන් හතර ගුණයකට වැඩි අගයක් විය. | ජංගම සේවාවන් හා කලාප මට්ටමින් නිවෙස් වලට ගොස් වරිපනම් මුදල් එකතු කිරීමේ කාර්යය මේ වන විටත් ආරම්භ කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2018 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 21 දක්වා හිඟ කඩ කුලී ශේෂය අඛණ්ඩව වැඩිවෙමින් පැවති අතර 2023 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී ශේෂය රු.13,218,503ක් විය. | හිඟ කඩ කුලී ශේෂය ලෙස දක්වා ඇති මුදලේ නිරවද්‍යතාවය පිළිබඳව ගැටලුකාරී තත්වයක් මතුව ඇත. නිරවද්‍යතාවය සම්බන්ධයෙන් පසුවිපරමක් සිදු කරනු ලබන අතර යම් වෙනස්කමක් සිදු වුවහොත් එය 2024 අවසන් ගිණුම්වලින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | හිඟ ශේෂය නිරවුල් කර ගැනීමට හා හිඟ මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු සියලු කාර්යයන් හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර නොතිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට අතුරු ව්‍යවස්ථා 06ක් පමණක් පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීමේ ප්‍රායෝගික ගැටලුවක් පවතී. පළාත් පාලන අමාත්‍යාංශය විසින් පොදු අතුරු ව්‍යවස්ථා මාලාවක් සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | අතුරු ව්‍යවස්ථා පනවා කටයුතු නීත්‍යානුකූල කරගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභාව විසින් 2023 වර්ෂයේ මාසිකව දිරන කසල ටොන් 200ක් සහ නොදිරන කසළ ටොන් 100ක් වශයෙන් වාර්ෂික එකතුව ටොන් 3600ක පමණ ප්‍රමාණයක් රු.5,596,364ක වියදමක් දරා රැස්කර තිබුණ අතර දිරන කසළ භාවිතා කරමින් 2023 වර්ෂයේ කොම්පෝස්ට් කිලෝග්‍රෑම් 7562ක් නිෂ්පාදනය කර අලෙවි කිරීම මඟින් රු.151,233ක ආදායමක් පමණක් රැස්කර තිබුණි. | මහජනතාව ගෙවත්ත තුළ වගා කිරීම ක්‍රමක්‍රමයෙන් අඩුවීම තුළ කොම්පෝස්ට් අලෙවිය ද අඩු වූ බව. | කොම්පෝස්ට් නිෂ්පාදය හා අලෙවිය ඉහළ නැංවීමේ වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | නගර සභාව සතු කඩ කාමර 166 කින් කඩකාමර 163 ක වලංගු ගිවිසුම් කාලය ඉක්මවා වසර 03 ක සිට වසර 10 ක් දක්වා කාලයක් ගතව ඇතත් එම කඩ කාමර නැවත ටෙන්ඩර් කර ගිවිසුම් ගත වීම සඳහා නගර සභාව විසින් කටයුතු කර නොතිබුණි. | විගණනයේදී අනාවරණය වූ පරිදි අදාළ ගිවිසුම් අලුත් කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව. | ගිවිසුම් කාලීනව අලුත් කිරීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඇ) | නගර සභා බල ප්‍රදේශය තුළ ඇති සියලු වෙළෙඳ, ව්‍යාපාර හා කර්මාන්ත ආයතන පිළිබඳ සමීක්ෂණ විධිමත්ව පවත්වා ලැයිස්තු පිළියෙල කර මාර්තු 31 දිනට ප්‍රථම ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීමට හා එම තොරතුරු ලේඛනගත කර ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | ලේඛන පිළියෙල කොට අදාළ හිඟ මුදල් සමඟ අදාළ පාර්ශව වලින් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | සමීක්ෂණ පවත්වා සියලු ආයතනවලින් ගාස්තු අයකිරීමට හා හිඟ ආදායම් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | අම්පාර මහජන උද්‍යානයේ පිහිටි පැරණි ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසුව උත්සව, සම්මන්ත්‍රණ, රැස්වීම් පැවැත්වීම සඳහා කුලියට ලබාදීම මඟින් නගර සභාවේ ආදායම් මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් අම්පාර මහජන උද්‍යානය සඳහා රු.2,445,535ක වියදමක් දරා 2023 ජුනි මස තුළ අදාළ මිලදී ගැනීම් සිදුකර තිබුණ ද එම භාණ්ඩ 2024 ජනවාරි 04 විගණිත දින වන විටත් භාවිතයට නොගෙන ගබඩා කර පවතින බව නිරීක්ෂණය වූ අතර අම්පාර මහජන උද්‍යානයෙහි පිහිටි ගොඩනැගිල්ල නවීකරණය කිරීමට පෙර මෙම මිලදී ගැනීම හේතුවෙන් මෙම භාණ්ඩ භාවිතයට ගෙන නොතිබිය දී ඒවායේ වගකීම් කාලයෙන් මාස 07ක් මේ වන විටත් ඉක්මවා ගොස් තිබුණි. | 2023 වසරේදී ප්‍රතිපාදන වෙන් වී තිබූ බැවින් හා අදාල ව්‍යාපෘතිය සඳහා අක්මුදල් අප්‍රමාදව ලබා ගැනීමේ අරමුණ හේතුවෙන් උක්ත භාණ්ඩ කඩිනමින් මිලදී ගැනීමට කටයුතු කර ඇත. භාණ්ඩවල වගකීම් කාල සීමාවෙන් සැලකිය යුතු කාලයක් මේ වන විට ගෙවී ගොස් ඇති බව. | වගකීම් කාලය ඉක්මවා යන බැවින් භාණ්ඩ භාවිතයට ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභා බල ප්‍රදේශයට අයත් දේපල මත 2005 වර්ෂයේ එනම් වසර 18 කට පෙර සිදුකරන ලද තක්සේරුවක් මත පදනම්ව 2023 වර්ෂය සඳහා වරිපනම් බදු අයකර තිබුණි. | මේ වන විට තක්සේරු කටයුතු තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරමින් පවතී. ඉතා මෑත කාලයේදී අදාළ තක්සේරු කිරීම් කටයුතු අවසන් වේ යැයි අපේක්ෂා කරන බව. | කාලීනව තක්සේරුකර බදු මුදල් අයකර ගත යුතුය. |
| (ආ) | නගර සභාව සතු කඩ කාමර 141 කින් 2009 සහ 2016 වර්ෂයේ තක්සේරු මත පදනම්ව 2023 වර්ෂයේ දී කඩ කුලී අයකර තිබුණි. | ලිපි මඟින් ඉල්ලීම් ඉදිරිපත් කොට ඇති අතර මේ වන විට අදාළ තක්සේරු කිරීම් සිදු කොට තක්සේරු වාර්තා ලැබෙමින් පවතින බව. | කාලීනව තක්සේරු කර කුලී මුදල් අයකර ගත යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාව සතුව පවතින අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන 10ක් වෙන්දේසියේ විකිණීමට කටයුතු නොකිරීම හේතුවෙන් නිෂ්ක්‍රීයව පැවතුණි. | නගර සභාව සතු අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන ඉදිරියේදි වෙන්දේසි කිරිමට කටයුතු සිදුකරන බව. | වාහන සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභාවට අයත් ඉඩම් 42ක් හා එම ඉඩම්වල පිහිටි ගොඩනැගිලිවල වටිනාකම හඳුනාගෙන උපලේඛන සකස් කිරීමට හා වත්කම් ලේඛන තුළ වටිනාකම් ඇතුළත් කර යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳව විධිමත් තක්සේරුවක් සිදු කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරන බව දන්වා සිටින අතර ඒ සඳහා යම් කාලයක් ගත වන බව. | වටිනාකම හඳුනාගෙන ලේඛනගත කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නගර සභාව සතු වාහන 12ක් අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය වූ අතර මේ හේතුවෙන් කුලියට ලබාදිය හැකි වාහන 05කින් ඉපයිය හැකි ආදායම නගර සභාවට අහිමි වී පැවතුණි. | අලුත්වැඩියාවන් සඳහා විශාල මුදලක් වැය වෙයි. ඒ සඳහා සභාවට දැරිමට හැකි ආදායම් තත්ත්වයක් නොමැති බව. | වාහන අලුත්වැඩියා කර භාවිතයට ගත යුතුය. |
| (ඇ) | නගර සභාව භාරයේ පවතින වාහන 19ක අයිතිය නගර සභාව නමට පවරා ගැනීමට | අයිතිය පවරා නොගත් වාහන සඳහා ඉදිරියේදි අයිතිය පවරා ගැනිමට කටයුතු සිදු කරන බව. | සභාව නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

විගණන දින වන විටත් සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නගර සභාවේ තනතුරු 74ක් පුරප්පාඩුව පැවතුණි. | මේ පිළිබඳව අදාළ ආයතන දැනුවත් කොට ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය සහ මුදල් රෙගුලාසි 133(1) ප්‍රකාරව අභ්‍යන්තර විගණනය මඟින් නගර සභාවේ සියලු කාර්යයන් ආවරණය වන පරිදි ආයතනික මෙහෙයුම් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා වූ නිර්දේශ සකස් කර නොතිබුණි. | අභන්තර විගණන කමිටුවක් 2022/2023 වර්ෂවල පත් කර ආයතනික මෙහෙයුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම හා කාර්යාලයීය කාර්යය සාධනය වැඩිදියුණු කිරීම සඳහා කටයුතු සිදු කර ඇති බව. | ජාතික විගණන පනත ප්‍රකාරව නගර සභාවේ සියලු කාර්යයන් ආවරණය වන පරිදි ආයතනික මෙහෙයුම් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ කාර්යයසාධනය ඉහළ නැංවීම සඳහා වූ නිර්දේශ සකස් කළ යුතුය. |

### 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01–2019 දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන සහ කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණනයේදී අනාවරණය කර ඇති පරිදි විගණන හා කළමනාකරණ කමිටුවක් පත් කර නොමැත. කෙසේ වෙතත්, විගණන උපදෙස් අනුව ඉදිරියේදී විගණන හා කළමනාකරණ කමිටුවක් පත් කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටින බව. | විගණන හා කළමනාකරණ කමිටුව සඳහා ක්‍රියා පටිපාටි ආරම්භ කර රැස්වීම් පැවැත්වීමට පියවර ගත යුතුය. |

### 4.3 පාරිසරික ගැටලු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අම්පාර නගර සභාව විසින් බුද්ධංගල පාර, තිස්සපුර යන ස්ථානයේ පවත්වාගෙන යන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා මධ්‍යම පරිසර | ප්‍රමාණවත් නොවන භෞතික හා මානව සම්පත් තුළින් මෙය නඩත්තු කිරීම | වලංගු පරිසර බලපත්‍රයක් ලබා |

| | | | |
|---|---|---|---|
| | අධිකාරියෙන් වලංගු පරිසර බලපත්‍රයක් ලබාගත යුතු වුවත්, පරිසර බලපත්‍රය කල් ඉකුත් වී වසර 1½ කට අධික කාලයක් ඉක්මවා තිබියදීත් පරිසර බලපත්‍රය අලුත් කිරීම සඳහා කටයුතු නොකර වලංගු පරිසර බලපත්‍රයක් නොමැතිව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් තිබුණි. | හා විධිමත් ආකාරයට සිදු කිරීම මහත් අපහසු කාරණයක් විය. පරිසර බලපත්‍රයක් ලබා ගැනීම සඳහා සපුරාගත යුතු ක්‍රියාවන් සම්පූර්ණ කර නොමැති වීම හේතුවෙන් මේ වන විට පරිසර බලපත්‍රයක් ලබාගත නොහැකි වී ඇති බව. | ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 නොවැම්බර් 21 විගණිත දින වන විට ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු පාරිසරික නිර්දේශයන් උල්ලංඝනය වන ආකාරයෙන් විවෘත භූමියේ නොදිරන කසළ එක් රැස් කර පැවතීම, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි හා නොහැකි ද්‍රව්‍ය වෙන්කර බැහැර නොකිරීම යනාදී කරුණු හේතුවෙන් දැඩි පරිසර හානියක් සිදුව තිබූ අතර නොදිරන කසල ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙලක් කෙරෙහි නගර සභාවේ කඩිනම් අවධානය යොමුවිය යුතුව පැවතුණි. | 2023.12.04 වන දින සිට එකතු කරන කසළ දිරන/ නොදිරන වශයෙන් වෙන් කර ලබා ගැනීම හා ඒ සඳහා මහජනතාව දැනුවත් කිරීම් සිදුකර ඇති බව. | පාරිසරික නිර්දේශයන් උල්ලංඝනය නොවන අකාරයට කසල කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වා ගත යුතුය. |

## 4.4 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව තිරසාර සංවර්ධන අරමුණු සහ පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස්කර එමඟින් අවශ්‍ය මූලා ප්‍රතිපාදන සැලසීමට සභාව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2024 අයවැය සකස් කිරීමේදී තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ප්‍රතිපාදන වෙන් කොට එම කාර්යයන් මේ වන විට අවසන් කොට ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන පරමාර්ථ සහ අරමුණු ළඟාකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |